සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 01 යි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර දී ඇති වරණ තුළින් තෝරා වරහන් තුළ ලියා දක්වන්න.

(01) පහත ඒවා අතුරෙන් භාව ප්‍රකාශනයෙන් තොර වූ ප්‍රාසාංගික කලා මාධ්‍යයක් වනුයේ,

(1) නාට්‍ය (2) බැලේ නාට්‍ය (3) නෘත්ත
(4) නෘත්‍ය (5) ඔපෙරා (........)

(02) "යම් ඥානයක් වේද, ශිල්පයක් වේද, විද්‍යාවක් වේද, කලාවක් වේද, ප්‍රයෝගයක් වේද ඒවා නාට්‍ය තුළ නොමැතිනම් ඒ නම දැරීමට සුදුසු නොවන්නේ ය."
ඉහත උධෘතය අයත් ග්‍රන්ථය වනුයේ,

(1) අභිනය දර්පණය (2) නාට්‍ය ශාස්ත්‍රය (3) කාව්‍ය ශාස්ත්‍රය
(4) දස රූපය (5) නාගානන්දය (........)

(03) "කලාව වූ කලී සන්නිවේදන කාර්යයේ උපරිම අවස්ථාවයි." මෙසේ ප්‍රකාශ කළේ,

(1) හර්බට් රීඩ් (2) ලියෝතෝල්ස්තෝයි (3) අයි. ඒ. රිචඩ්
(4) ඇරිස්ටෝටල් (5) භරතමුනි (........)

(04) 'ප්‍රේක්ෂාව' යන්න සඳහා වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ප්‍රේක්ෂකයා ඉදිරියේ මොහොතින් මොහොත මැවෙන දර්ශනයයි.
(2) රූපණ ශිල්පීන් සතු වගකීමයි.
(3) ප්‍රේක්ෂකයාගේ කාර්යයයි.
(4) රංගභූමි පාලකගේ වගකීමයි.
(5) ප්‍රේක්ෂකාගාරයෙන්, ප්‍රේක්ෂකාගාරයට වෙනනස් ය. (........)

(05) වෙස් මුහුණු භාවිතා කරන ලද නාට්‍ය සම්ප්‍රදාය නොවන්නේ,

(1) ග්‍රීක නාට්‍ය (2) සොකරි නාට්‍ය (3) ජපන් නාට්‍ය
(4) සංස්කෘත නාට්‍ය (5) ක්යෝගන් නාට්‍ය (........)

(06) ඉතිවෘත්තයේ කථාගායක ගායිකා සම්බන්ධ වන කතා පුවත,

(1) බීජ (2) ආධිකාරිත (3) ප්‍රාසාංගික
(4) විශ්කම්භ (5) ආරම්භ (........)

(07) 'අසත්‍ය' සංකල්පයක් වශයෙන් මුලින් ම හඳුනාගනු ලැබුවේ,

(1) ග්‍රීක නාට්‍යයේ (2) සංස්කෘත නාට්‍යයේ (3) නාඩගම්වල
(4) නූර්ති නාට්‍යයේ (5) ශේක්ෂ්පියර් නාට්‍යයේ (........)

(08) ආංගික අභිනයට අයත් අංග වනුයේ,

(1) සංවාද හා භාව ප්‍රකාශන (2) රංගභාණ්ඩ හා අංග රචනා
(3) ඇඳුම් පැළඳුම් හා අංගරචනා (4) අංග ප්‍රත්‍යාංග උපාංග
(5) පසුතල, ආලෝකය (........)

(09) නාට්‍ය ශාස්ත්‍රයට අනුව සත්ත්වික භාව ගණන,

(1) 4 (2) 8 (3) 9 (4) 2 (5) 3 (........)

(10) බර්ටෝල් බ්‍රේෂ්ට්ගේ රංග රීතිය වනුයේ,

(1) ආඛ්‍යාන රංගයයි. (2) ස්වභාවික වාදයයි. (3) යථාර්ථ වාදයයි.
(4) නාට්‍යධර්මීය. (5) රෝමාන්තික රංගයයි. (........)

(11) භරතමුනි නාට්‍ය ශාස්ත්‍රයේ හඳුන්වාදුන් අට වැදෑරුම් රස සංකල්පයට අයත් නොවන භාවය ලෙස,

(1) රතිය (2) භය (3) ශෝක
(4) ජුගුප්සාව (5) ශ්‍රම (........)

(12) ක්‍රමයෙන් අනාවරණය වෙමින් ආ සිදුවීම් මාලාව තුළ අනපේක්ෂිත ගැටළු මතු වී කථාව සංකීර්ණ වීම ඇරිස්ටෝටල් හඳුන්වනුයේ,

(1) අනාවරණය (2) ආකූලීකරණය (3) චින්තනය
(4) ප්‍රත්‍යාවර්තනය (5) ප්‍රත්‍යාභිඥානය (........)

(13) "නාට්‍යයේ එක් සිද්ධියකට පමණක් සීමාවන" අර්ථ ප්‍රකෘතියක් ලෙස සලකනුයේ,

(1) බීජ (2) බිංදු (3) පතාත
(4) ප්‍රකරි (5) කාර්ය (........)

(14) "ප්‍රාප්ත්‍යාශා" නම් අවස්ථාව යනුවෙන් හඳුන්වන්නේ,

(1) නාට්‍යයේ සංෂිප්තයෙන් කියවීමයි.
(2) කථා නායක නායිකා දෙපලගේ අරමුණු ඉටුවීමයි.
(3) කථා නායකයාගේ අරමුණු ඉටුවේයැයි පවතින කුතුහලයයි.
(4) කථා නායක නායිකා බලාපොරොත්තු ඉටු වීමයි.
(5) නේතෘගේ බලාපොරොත්තු ඉටුවේයැයි ලැබෙන ඉඟියයි. (........)

(15) භරතමුනිගේ අට වැදෑරුම් සාත්ත්වික භාවයට අයත් නොවන්නේ,

(1) ස්ථම්භ (2) වේපථු (3) ස්වේද
(4) අශ්‍රැ (5) ශ්‍රම (........)

(16) රූපණ කාර්යයේ සාර්ථකත්වය උදෙසා නළුවකු ප්‍රගුණ කළ යුත්තේ,

(1) සංවේදන අභ්‍යාසයි. (2) ශිථිලීකරණ අභ්‍යාසයි (3) හඬ අභ්‍යාසයි.
(4) පරිකල්පන අභ්‍යාසයි (5) ඉහත දැක්වූ සියල්ලමයි. (........)

(17) ස්ටැනිස්ලාව්ස්කිගේ රූපණ විධික්‍රමයට සම්බන්ධ කරුණු 2 කි.

(1) රස භාව හා භාත්විකභාව (2) භාවමය ස්මෘතිය හා ශිථිලීකරණ
(3) පාඩම හා භාව (4) භාව විශෝධනය හා කැතාසීස්
(5) රසභාව හා කැතාසීස් (........)

(18) අර්ථෝෂක්ෂේප ක්‍රම වලට අයත් වනුයේ,

(1) අර්ථ ප්‍රකෘතිය. (2) අවස්ථාය. (3) සූච්‍ය කොටස් ය.
(4) ප්‍රාසාංගික ය. (5) ආධිකාරිත ය. (........)

(19) නාඩගම් විශේෂ ලක්ෂණ නොවනුයේ,

(1) නිශ්චිත පෙළක් නොමැතිවීම. (2) කර්ණාටක සංගීතය භාවිතය.
(3) පොතේගුරෙකු සිටීම. (4) පිරිමින් රංගනයේ යෙදීම.
(5) පූර්ව රංගයකින් ආරම්භ වීම. (........)

- පහත සඳහන් ශාන්ති කර්ම ඇසුරෙන් 20 සිට 24 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A රටයැකුම | B සන්නියැකුම | C සූනියම් යාගය |
| D දෙවොල්මඩුව | E කොහොඹාකංකාරිය | F පහන් මඩුව |
| G ආලවක දමනය | H මිලින්ද ප්‍රශ්නය | |

(20) සශ්‍රිකත්වය අරබයා සිදුකරන ලද ශාන්ති කර්මයකි.

(1) D සහ E (2) A සහ B (3) E සහ F
(4) G සහ H (5) E සහ G (........)

(21) බෞද්ධ පූජාකර්ම ලෙස,

(1) EF (2) GH (3) FH (4) AB (5) CG (........)

(22) විශේෂිත වූ පුද්ගලයන් සඳහා කරනු ලබන ශාන්ති කර්ම අතරට,

(1) AC (2) AD (3) CD (4) FD (5) AC (........)

(23) රෝග නිවාරණ ශාන්ති කර්මයකි,

(1) AB (2) FB (3) AC (4) FE (5) GH (........)

(24) ඇත් බන්ධනය හා මී බන්ධනය ඇතුළත් ශාන්තිකර්මය ?

(1) සන්නියැකුම (2) දෙවොල් මඩු (3) රටයැකුම
(4) සූනියම් යාගය (5) කොහොඹා කංකාරිය (........)

පහත දැක්වෙන සංගීත භාණ්ඩ ඇසුරෙන් 25 සිට 28 තෙක් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A උඩැක්කි | E සර්පිනාව | I මෘදංගය |
| B මද්දල | F වීණාව | J තබ්ලාව |
| C ඩොල්කිය | G හොරණෑව | |
| D සොෂක බෙරය | H ගැටබෙරය | |

(25) 'නාඩගම් ගී' වාදනය කළ වාද්‍ය භාණ්ඩය වනුයේ,

(1) A (2) B (3) C (4) E (5) F (........)

(26) සොකරි සඳහා වාදනය කළ වාද්‍ය භාණ්ඩ ලෙස,

(1) AH (2) DH (3) CE (4) BI (5) JE (........)

(27) කෝලම් සඳහා යොදාගන්නා වාද්‍ය භාණ්ඩ ලෙස,

(1) AB (2) DG (3) IJ (4) DH (5) EJ (........)

(28) නූර්ති සඳහා බහුලව යොදාගන්නා ලද්දේ,

(1) BI (2) BC (3) EF (4) DH (5) EJ (........)

(29) ඇරිස්ටෝටල් නාට්‍යයේ වැදගත් ම අංගයක් ලෙස සැලකුයේ,

(1) චින්තනය (2) වස්තුව (3) වාග් විලාසය
(4) චරිත (5) ප්‍රේක්ෂාව (........)

The National e-Learning Portal for the General Education

(30) ලංකාවේ සම්භාව්‍ය ඉංග්‍රීසි නාට්‍ය කලාව බිහි කිරීමෙහිලා පුරෝගාමියෙකි.
(1) නියුටන් ජුබාල් (2) ඊ. එෆ්. සී. ලුඩෝවොයික් (3) රුවන්ති ඩි චිකේරා
(4) ජෙරොම් ද සිල්වා (5) රංජනී ඔබේසේකර (........)

(31) කිරි මඩුවේ නාට්‍යමය අවස්ථාවක් ලෙස,
(1) ආඬිගුරු නැටීම (2) කුරුම්බර නැටීම (3) අඹ විදමන
(4) කපුයක්කන්කාරිය (5) පැදුරේ දැපවිල්ල (........)

(32) 1824 දී නිර්මාණය වූ සිංහලේ නාඩගම වන්නේ,
(1) හරිශ්චන්ද්‍ර (2) මාතලන් (3) ඇහැලේපොළ
(4) ශ්‍රී වික්‍රම (5) රාමායනය (........)

(33) කෝලම් රංග ශෛලියේ විශේෂතා අතරට,
(1) ලෝක ධර්මී රංග ශෛලිය යොදාගැනීම. (2) රාත්‍රී කිහිපයක් පැවැත්වීම.
(3) ඒකාකාරී සංගීතය
(4) කාරියකරවන රාළ විසින් පාත්‍රයින්ගේ පැමිණීම හැඳින්වීම.
(5) පොතේගුරෙකු හා ගායක පිරිසක් සිටීම. (........)

(34) පාස්කු නාට්‍යයේ විශේෂතා අතරට,
(1) ගෘහස්ථ රංග භූමි යොදාගැනීම. (2) කාලීන තේමා වස්තු විෂය වීම.
(3) නාට්‍යධර්මී රංග ශෛලියට අදාළ වේෂභූෂණ නිර්මාණය වීම.
(4) පසුතල නිර්මාණ යොදා ගැනීම. (5) ගද්‍ය සංවාද භාවිතය (........)

(35) බී. ඒ. ඩබ්. ජයමාන්න නිර්මාණය කළ මිනර්වා නාට්‍යයක් ලෙස,
(1) කඩවුණු පොරොන්දුව (2) ප්‍රතාප්සිං (3) රොඩී කෙල්ල
(4) සීදේවි (5) පිටිසර කෙල්ල (........)

(36) මහාකවි විලියම් ශේක්ස්පියර්ගේ නාට්‍ය අතරට නොයෙන්නේ,
(1) ඇන්ටිගනී (2) ඔතෙලෝ (3) හැම්ලට්
(4) මැක්බෙත් (5) රාමායනය (........)

(37) ඇන්ටිගනී කථාවට සම්බන්ධ නව අර්ථකථන සහිත නාට්‍ය ඉදිරිපත් කළ නාට්‍යකරුවන් අතර,
(1) ෂෝ අනුඉල් (2) ශේක්ස්පියර් (3) ස්ටැනිස්ලාව්ස්කි
(4) බර්නාඩ් ෂෝ (5) සැමුවෙල් බෙකට් (........)

(38) හස්තිකාන්ත මන්තරේ නාට්‍ය පෙළ සඳහා යොදාගත් පුරාවෘත්තයක් ලෙස,
(1) මහාවංශයේ කථා (2) කාලිදාසගේ මේඝදූතය (3) චීන නාට්‍යයකි.
(4) ග්‍රීක නාට්‍යයකි (5) දමිළ නාට්‍යයකි. (........)

(39) සංස්කෘත වේදිකාවේ රංගභූමි අලංකරණ වල එන යාන්ත්‍රික උපකරණ හැඳින්වූයේ,
(1) ව්‍යාජිම (2) සන්ධිම (3) වේෂ්ටික
(4) අංක (5) අවස්ථා (........)

(40) 'එකුක්ක්ලීමා' නමැති යන්ත්‍රය භාවිතා කළ නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,
(1) නෝ (2) ග්‍රීක (3) කබුකි
(4) ක්යෝගන් (5) සංස්කෘත (........)

(ල. 01 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - II

**12 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

## A කොටස

01. (i) ප්‍රාසාංගික කලාවට ආවේනික ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 4)

(ii) නාට්‍ය කලාව සෙසු ප්‍රාසාංගික කලා 02 කින් වෙනස්වන අයුරු පහදන්න. (ලකුණු 5)

(iii) ප්‍රාසාංගික කලා අතර නාට්‍ය කලාව දරන සුවිශේෂී ස්ථාන සාකච්ඡා කරන්න. (ලකුණු 6)

02. (i) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ශාන්තිකරම් මොනවාද? (ලකුණු 4)

(ii) එයින් පහතරට ශාන්තිකර්මයට අයත් නාට්‍යමය අවස්ථාව පහදන්න. (ලකුණු 5)

(iii) සබරගමු පළාතට අයත් දේව තොවිලයක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 6)

03. (i) ඓතිහාසික කථාවස්තුවක් පදනම් කරගත් 'සුභ සහ යස' නාට්‍යය කැපී පෙනෙන්නේ ඇයි? (ලකුණු 4)

(ii) එම නාට්‍යයෙන් ඉදිරිපත් කරන දේශපාලන, ආර්ථික, සමාජ විවරණ කෙසේද? (ලකුණු 5)

(iii) සයිමන් නවගත්තේගමගේ සුවිශේෂීත්වය පහදන්න. (ලකුණු 6)

## B කොටස

04. (i) නූර්ති කලාවේ ආරම්භය හා නාඩගම් කලාවේ පරිහානියට හේතු ලියන්න. (ලකුණු 4)

(ii) නූර්ති කලාව ජනප්‍රිය වීමට හේතු ලියන්න. (ලකුණු 5)

(iii) විශ්ව විද්‍යාලයීය නාට්‍යවංශය තුළ මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ දායකත්වය පිළිබඳ විමසන්න. (ලකුණු 6)

05. (i) 'ඇන්ටිගනී' නාට්‍යයට පසුබිම වූ පුරාවෘත්තය ලියන්න. (ලකුණු 4)

(ii) එම නාට්‍යයේ ප්‍රධාන තේමාව කුමක්ද? (ලකුණු 5)

(iii) ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය වර්ගයේ විකාශනය පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 6)

06. (i) අභිඥාන ශාකුන්තලයට පදනම් වූ මූලාශ්‍රය ලියන්න. (ලකුණු 4)

(ii) 'අවස්ථා' සකුන්තලා ඇසුරින් පහදන්න. (ලකුණු 5)

(iii) සංස්කෘත නාට්‍යයේ කතාවස්තුව බෙදෙනාකාරය නිදසුන් මගින් පහදන්න. (ලකුණු 6)